# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2144/47 - 2019 ඔක්තෝබර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1955 ගුවන් සංතරන නියාමන රෙගුලාසි**

රෙගුලාසි 126 යටතේ දැන්වීම

**කලාපීය වාණිජ ගුවන් ගමන් සඳහා දේශීය ගුවන්තොටුපළ විවෘත කිරීම**

කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය ගුවන්තොටුපළ විවෘත කිරීම සම්බන්ධයෙන් රජය විසින් ගනු ලැබ ඇති තීරණයට අනුව, පහත සඳහන් නියමයන් හා කොන්දේසි වලට යටත්ව කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ගුවන්තොටුපළ විවෘත කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ගුවන්තොටුපලේ නම | ගුවන්තොටුපළේ පිහිටීම | | | |
|---|---|---|---|---|
| | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | දිස්ත්‍රික්කය | පළාත |
| මඩකලපුව ගුවන්තොටුපළ (ස්ථාන දර්ශකය : VCCB, ගුවන්තොටුපළ හඳුනාගැනුම : BTC) | පුතුනගර් | මන්මුනායි උතුර | මඩකලපුව | නැගෙනහිර පළාත |
| යාපනය ගුවන්තොටුපළ (ස්ථාන දර්ශකය : VCCJ, ගුවන්තොටුපළ හඳුනාගැනුම : JAF) | මයිලඩ්ඩි උතුර<br>මයිලඩ්ඩි දකුණ<br>කුරුම්බ පලාළි උතුර<br>පලාළි දකුණ | වලිකාමම් උතුර | යාපනය | උතුරු පළාත |
| රත්මලාන ගුවන්තොටුපළ (ස්ථාන දර්ශකය : VCCC, ගුවන්තොටුපළ හඳුනාගැනුම : RML) | කඳවල | රත්මලාන | කොළඹ | බස්නාහිර පළාත |

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 31 වන වගන්තියේ (අ), (ආ), (ඇ). (ඉ), (ඊ), (උ), (ඌ) සහ (ඔ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ගගනගාමී සේවා, ඉහත සඳහන් ගුවන්තොටුපළවල සැපයීම සඳහා සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, සේවා සපයන්නා ලෙස පත්කරනු ලැබ ඇත.

1A - G 31229 — 67 (2019/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ගුවන්තොටුපළ වල භෞතික ලක්ෂණ හා පහසුකම් හා සේවා කාලය ඇතුළුව එම ගුවන්තොටුපළවල ඇති සේවාවන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ නිල වෙබ් අඩවියේ (www.caa.lk) ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ගගනගාමී තොරතුරු පැකේජයේ (AIP) සපයා ඇත.

ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ විදේශීය ගමනාන්ත වෙත පිටත්වයන ගුවන්යානාවලට, ඉහත සඳහන් ගුවන්තොටුපළවලට පළමුව ගොඩබෑමට හෝ අවසාන වශයෙන් ඒවායෙන් පිටත්වීමට අවසර ඇති අතර, එම ගුවන්යානා විසින් එම ගුවන්තොටුපළවල දී, ගුවන් ගමන් සඳහා මගීන්, ගමන්මළු, භාණ්ඩ සහ තැපැල අදාළ වන පරිදි ගොඩබෑම හෝ පැටවීම කරනු ලැබිය හැකිය.

ඒ අනුව, ඉහත සඳහන් ගුවන්තොටුපළ තුළට සහ ඉන් පිටතට ක්‍රියාත්මක වන සෑම ගුවන්යානයක්ම දේශසීමා පාලනයට අදාළ වන ජාතික නීති, රෙගුලාසි, රීති සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර ඒඅයිපී (AIP) හි ප්‍රකාශයට පත් කර ඇති ගුවන්යානා ඇතුළුවීම හා පිටත්වීම සම්බන්ධ ස්ථාපිත මෙහෙයුම් ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතු ය.

ඉහත සඳහන් ගුවන්තොටුපළ තුළට සහ ඉන් පිටතට යන සෑම මගියෙකුම අදාළ වන ජාතික නීති, රෙගුලාසි, රීති සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට සහ පුද්ගලයින් සහ ගමන් මලු ඇතුළුවීම හා පිටවීම සම්බන්ධව ස්ථාපිත මෙහෙයුම් ක්‍රියාපටිපාටිවල අනුකූල විය යුතු අතර එම කටයුතු සම්බන්ධයෙන්, රේගු ආගමන සහ විගමන, ගුවන් සේවා ආරක්ෂාව, මහජන සෞඛ්‍ය, ශාක හා සත්ව නිරෝධායන සහ මත්ද්‍රව්‍ය පාලනය යනාදීය භාරව කටයුතු කරන අදාළ රජයේ බලධාරීන් විසින් සිදු කරනු ලබන අදාළ නිෂ්කාශන සහ පරීක්ෂණ කටයුතුවලට භාජනය විය හැකිය.

ඉහත සඳහන් ගුවන්තොටුපළවල තැපැල් සහ වෙනත් ලිපි ඇතුළුව සියලුම අභ්‍යන්තර හෝ පිටතට යන භාණ්ඩ, අදාළ වන ජාතික නීති, රෙගුලාසි, රීති සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට සහ භාණ්ඩ, තැපැල් සහ වෙනත් භාණ්ඩ ඇතුළුකිරීම හා පිටකිරීම සම්බන්ධ ස්ථාපිත මෙහෙයුම් ක්‍රියාපටිපාටිවලට අනුකූල විය යුතු අතර එවැනි භාණ්ඩ, තැපැල් සහ වෙනත් ලිපි අදාළ රේගු, ගුවන් සේවා සුරක්ෂිතතාව, මහජන සෞඛ්‍ය, ශාක හා සත්ව නිරෝධායනය සහ මත්ද්‍රව්‍ය පාලනය යනාදිය භාරව කටයුතු කරන අදාළ රජයේ බලධාරීන් විසින් සිදු කරනු ලබන අදාළ නිෂ්කාශන සහ පරීක්ෂණ කටයුතුවලට භාජනය විය හැකිය.

ගුවන්තොටුපළ ක්‍රියාකරු විසින් නිකුත් කරනු ලැබූ වලංගු සහ විධිමත් ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍රයක් ඇත්නම් සහ එය පරීක්ෂා කිරීම පිණිස පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කර ඇත්නම් මිස කිසිදු පුද්ගලයකුට හෝ වාහනයකට හෝ එම පුද්ගලයා හෝ වාහනය රැගෙන යන කිසිදු භාණ්ඩයකට හෝ ආරක්ෂක සීමා සහිත ප්‍රදේශයක් (Security restricte darea) ලෙස නම් කර ඇති කිසිදු ගුවන්තොටුපළ ප්‍රදේශයකට ඇතුළු වීමට හෝ රැඳී සිටීමට අවසර නොලැබේ. වලංගු ගමන් ලියකියවිලි ඇති මගියෙකුට සහ එම ගුවන්තොටුපළවලින් ආරම්භ වන හෝ පිටතට යන ගුවන් ගමනක් සඳහා ගුවන්යානා වලංගු ප්‍රවේශ පත්‍රයක් සහිත මගීන් සඳහා, ආරක්ෂක පරීක්ෂණ ක්‍රමවේදයන්ට අවනත වන්නේනම්, මෙම තහනම බලපවත්වන්නේ නැත.

ගුවන්තොටුපළ පරිශ්‍රය තුළ සහ ඒ අවට ඩ්‍රෝන ඇතුළු මිනිසුන් රහිත ගුවන් යානා පියාසර කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

එච්. එම්. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්.

10 - 902

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.